**ශීර්ෂය 229 - නීතිපති දෙපාර්තමේන්තුව**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ශීර්ෂය 229 - නීතිපති දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව නීතිපති දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 30 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 ජුනි 24 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට නීතිපති දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තරකර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතු ය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උපවගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වාගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු ය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණයකර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම්කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 ගිණුම් ඉදිරිපත් කිරීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 දෙසැම්බර් 31 දිනට බැංකු ප්‍රකාශයේ ශේෂය රු.9,906,350 ක් වුව ද, මූල්‍ය ප්‍රකාශනයේ ඇමුණුම (viii) හි බැංකු ගිණුම් පිළිබඳ තත්ත්ව වාර්තාවෙහි එම ශේෂය රු.5,903,350 ක් ලෙස දක්වා තිබුණි. | 2023 දෙසැම්බර් 31 දිනට බැංකු ප්‍රකාශයේ ශේෂය රු.9,906,350 ක් වන අතර, දෙසැම්බර් මාසය තුළ බැංකුවට ඉදිරිපත් වී ඇති රු.5,903,350 ක් වූ චෙක්පත් වටිනාකම බැංකු ප්‍රකාශනය අනුව ශේෂය ලෙස අතපසුවීමකින් සටහන් වී ඇති බව දන්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශනයේ බැංකු ගිණුම් පිළිබඳ තත්ත්ව වාර්තාවේ බැංකු ප්‍රකාශනය අනුව ශේෂය නිවැරදිව දැක්විය යුතු ය. |

**1.6.2 ගිණුම්කරණ අඩුපාඩු**

**(අ) ආදායම් ලැබීම්**

දෙපාර්තමේන්තුවට අදාළ ආදායම් ලැබීම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | වර්ෂය තුළ අපහරණය කරන ලද භාණ්ඩ විකිණීමෙන් ලද රු.47,600ක් වූ වටිනාකම මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම යටතේ දැක්විය යුතු වුව ද, එය මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ දක්වා තිබුණි. | භාණ්ඩ අපහරණ ආදායම් විවිධ ආදායම් සංකේතාංකය වන 20-06-02-02 ට බැර කිරීම නිසා එය වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායමක් ලෙස මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ දක්වා ඇති බව දන්වා තිබුණි. | වත්කම් විකිණීමෙන් ලද ආදායම් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ නිවැරදිව දැක්විය යුතු ය. |
| (ii) | 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනයේ (ඒසීඒ - I) හිඟ ආදායම් රැස්කිරීම් වටිනාකම රු.68,459,891 ක් වුව ද, එය හිඟ ආදායම් පිළිබඳ ප්‍රකාශයේ (ඒසීඒ - I (i))රු.68,460,691 ක් වූයෙන් රු.800 ක වෙනසක් පැවතුණි. | ආදායම් ප්‍රකාශනයේ (ඒසීඒ 1)හි හා (ඒසීඒ 1 (i)) හි සඳහන් හිඟ ආදායම් රැස් කිරීමේ අගය රු. 68,500,966 ක් ලෙස නිවැරදි විය යුතු අතර, අතපසුවීමකින් එය (ඒසීඒ 1) හි රු.68,459,891 ක් හා (ඒසීඒ 1 (i)) හි රු.68,460,691 ක් ලෙස සඳහන් වී ඇති බව දන්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශනයේ හිඟ ආදායම් නිවැරදිව දැක්විය යුතු ය. |

| | | | |
|---|---|---|---|
| **(iii)** | 2023 දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම් පිළිබඳ ප්‍රකාශනයේ (ඒසීඒ I(i)) වර්ෂ ආරම්භක ශේෂය රු.301,540,829 ක් වුව ද, පසුගිය වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනය අනුව එම ශේෂය රු.302,922,679 ක් වූයෙන් ආරම්භක ශේෂය රු.1,381,850කින් අඩුවෙන් දක්වා තිබුණි. | 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයෙහි සඳහන් අවසාන ශේෂය රු.302,922,679 ක් වුව ද, අත් හැරී තිබූ ණයශේෂ නිවැරදි කිරීමෙන් 2023 ජනවාරි 01 දිනට නිවැරදි ශේෂය රු.304,959,554 ක් වුව ද, අතපසු වීමකින් එය හිඟ ආදායම් පිළිබඳ ප්‍රකාශනයේ රු.301,540,829 ක් ලෙස සඳහන් වී ඇති බව දන්වා තිබුණි. | හිඟ ආදායම් පිළිබඳ ප්‍රකාශනයේ ආරම්භක ශේෂය නිවැරදිව දැක්විය යුතු ය. |
| **(iv)** | ඒසීඒ - I(i)හිඟ ආදායම් පිළිබඳ ප්‍රකාශයේ වාර්තා කරනු ලබන වසරට අදාළ හිඟ මුදල් රු.88,412,643 ක් වුව ද, 2023 දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම් ලේඛනය අනුව එම අගය රු.88,257,968 ක් වූයෙන් රු.154,675 ක වෙනසක් පැවතුණි. | හිඟ ආදායම් පිළිබඳ ප්‍රකාශයේ සඳහන් රු. 88,412,643 ක් වූ වාර්තා කරනු ලබන වසරට අදාළ මුදල හිඟ ආදායම් ලේඛනයේ පරිදි රු.88,257,968 ක් ලෙස නිවැරදි විය යුතු බව දන්වා තිබුණි. | හිඟ ආදායම් පිළිබඳ ප්‍රකාශනයේ හිඟ මුදල් නිවැරදිව දැක්විය යුතු ය. |
| **(v)** | ඉහත (ii),(iii),(iv) වෙනස්කම් ගැලපූ පසු 2023 දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම් ශේෂය රු.322,720,756 ක් වුව ද, හිඟ ආදායම් ලේඛනය අනුව එම ශේෂය රු.324,716,556 ක් වූයෙන් රු.1,995,800 ක වෙනසක් පැවතුණි. | ඉහත (ii),(iii),(iv) වෙනස්කම් ගැලපූ පසු 2023 දෙසැම්බර් 31 දිනට නිවැරදි හිඟ ආදායම් ශේෂය රු.324,716,556 ක් වන බව ද, ඒ අනුව හිඟ ආදායම් පිළිබඳ ප්‍රකාශයේ සඳහන් රු.321,492,781 ක මුදල ද වෙනස් විය යුතු බව දන්වා තිබුණි. | නිවැරදි හිඟ ආදායම් ශේෂ දැක්විය යුතු ය. |
| **(vi)** | ඒසීඒ - (i) ප්‍රකාශයේ පසුගිය වසරට පෙර වසර වන විට හිඟ මුදල් අය කරගැනීම් රු.23,118,010 ක් ලෙස දක්වා තිබුණ ද, 2023 අය කරගත් ආදායම් උපලේඛනය අනුව එම ශේෂය රු.23,117,210 ක් විය.ඒ අනුව රු.800 ක වෙනසක් විය. | ඒසීඒ 1(i) ප්‍රකාශයේ පසුගිය වසරට පෙර වසර වන විට හිඟ මුදල් අය කර ගැනීම රු.23,118,010 ක් ලෙස දක්වා තිබුණ ද, එය රු.23,158,285 ක් ලෙස නිවැරදි විය යුතු ඇති බව දන්වා තිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීම් නිවැරදිව දැක්විය යුතු ය. |
| **(vii)** | 2023 වර්ෂයේ ආදායම් ප්‍රකාශයේ (ඒසීඒ -I) ශුද්ධ ආදායම රු.124,556,616 ක් වුව ද, ඒසීඒ -I(iii) ආකෘතියේ සත්‍ය ආදායම රු.124,597,691 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව රු.41,075 ක වෙනසක් විය. | ඒසීඒ1(iii) ආකෘතියේ සත්‍ය ආදායම වූ රු. 124,597,691 ක මුදල නිවැරදි වන අතර, ඒ අනුව (ඒසීඒ1) හි සඳහන් ශුද්ධ ආදායම ද රු. 124,597,691 ක් ලෙස නිවැරදි විය බව දන්වා තිබුණි. | ශුද්ධ ආදායම නිවැරදිව දැක්විය යුතු ය. |
| **(viii)** | 2023 වර්ෂයේ ආදායම් වාර්තාව හා භාණ්ඩාගාර මුද්‍රිත SA - 20 මාසික ආදායම් සාරාංශය අනුව රු.41,075ක වෙනසක් විය. | භාණ්ඩාගාර මුද්‍රිත SA – 20 මාසික ආදායම් සාරාංශයෙහි සඳහන් රු.124,597,691 ක මුදල නිවැරදි ශුද්ධ ආදායම බව දන්වා තිබුණි. | ආදායම් නිවැරදිව දැක්විය යුතු ය. |

**(ආ) දේපල පිරියත හා උපකරණ**

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩුව අනාවරණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 වර්ෂයේ අපහරණය කරන ලද භාණ්ඩ විකිණීමෙන් ලත් ආදායම රු. 47,600 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනයේ දක්වා තිබුණ ද, රු.663,396 ක් වූ අපහරණය කරන ලද භාණ්ඩවල වටිනාකම මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ අපහරණය කරන ලද වත්කම් ලෙස දක්වා නොතිබුණි. | 2023 වර්ෂයට අදාළ භාණ්ඩ අපහරණ වටිනාකම් නිවැරදි ලෙස සිගාස් මගින් ගිණුම්ගතකර ඇති නමුත්, තාක්ෂණික දෝෂයක් හේතුවෙන් සිගාස් වෙබ් යෙදුම මගින් ලබාගන්නා ලද මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ අදාළ වටිනාකම් පෙන්නුම් නොකරන බව දන්වා තිබුණි. | මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ අපහරණය කරන ලද වත්කම් නිවැරදිව දැක්විය යුතු ය. |

**(ඇ) අග්‍රිම ශේෂය**

අග්‍රිම ශේෂය ගිණුම්ගත කිරීමේ දී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | දෙපාර්තමේන්තු ශේෂ පිරික්සුම අනුව අනෙකුත් ශීර්ෂ වෙනුවෙන් වාර්තාකරණ ආයතනය විසින් දරන ලද වියදම් රු.866,360 ක් වුවත්, එය රු. 97,800 ක් ලෙස දක්වා තිබීමෙන් රු.768,560 ක් අඩුවෙන් අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ දක්වා තිබුණි. | රු.768,560 ක් වූ මුදල අනෙකුත් ශීර්ෂ වෙනුවෙන් වාර්තාකරණ ආයතනය විසින් අත්තිකාරම් 'බී' ගිණුම වෙනුවෙන් කරන ලද හර කිරීමක් ලෙස සඳහන් කර ඇති බව දන්වා තිබුණි. | අග්‍රිම සැසඳුම් ප්‍රකාශනයේ නිවැරදි වියදම් දැක්විය යුතු ය. |
| (ii) | අනෙකුත් ශීර්ෂ වෙනුවෙන් වාර්තාකරණ ආයතනය විසින් අත්තිකාරම් 'බී' ගිණුම වෙනුවෙන් කරන ලද හර කිරීම් දෙපාර්තමේන්තු ශේෂ පිරික්සුම අනුව රු. 60,000 ක් වුවත්, එය රු. 768,560 ක් ලෙස රු.708,560 ක් වැඩියෙන් අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ දක්වා තිබුණි. | රු.768,560 ක මුදල අනෙකුත් ශීර්ෂ වෙනුවෙන් වාර්තාකරණ ආයතනය විසින් අත්තිකාරම් 'බී' ගිණුම වෙනුවෙන් කරන ලද හර කිරීමක් ලෙස දැක්වීම මෙම වෙනසට හේතු වී ඇති බව ද, රු.60,000 ක මුදල ගිණුම් ගත කිරීමේ දී සිදුව තිබූ වැරදි නිවැරදි කිරීමක් බැවින් එය අග්‍රිම සැසඳුම් ප්‍රකාශයෙන් ඉවත්කර ඇති බව දන්වා තිබුණි. | අග්‍රිම සැසඳුම් ප්‍රකාශනයේ අත්තිකාරම් 'බී' ගිණුමට අදාළ හර කිරීම නිවැරදි ලෙස දැක්විය යුතු ය. |

| | | | |
|---|---|---|---|
| **(iii)** | අනෙකුත් ශීර්ෂ වෙනුවෙන් වාර්තාකරණ ආයතනය විසින් අත්තිකාරම් 'බී' ගිණුම වෙනුවෙන් කරන ලද බැරකිරීම් රු.10,937,503 ක් වුව ද, එය රු. 10,877,503 ක් ලෙස රු.60,000 ක් අඩුවෙන් අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ දක්වා තිබුණි. | රු. 60,000 ක මුදල ගිණුම් ගත කිරීමේදී සිදුව තිබූ වැරදි නිවැරදි කිරීමක් සඳහා යොදන ලද හරස් සටහන් මාරු පත්‍රයක් බැවින් එය අග්‍රිම සැසඳුම් ප්‍රකාශයෙන් ඉවත් කර ඇති බව දන්වා තිබුණි. | අග්‍රිම සැසඳුම් ප්‍රකාශන අත්තිකාරම් 'බී' ගිණුම වෙනුවෙන් කරන ලද බැර කිරීම නිවැරදි ලෙස සටහන් කළ යුතු ය. |

**(ඇ)** **ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **වාහන ලොග් පොත**<br>දෙපාර්තමේන්තුව විසින් මුදල් රෙගුලාසි 1645 (අ) ප්‍රකාරව වාහන 09 කට අදාළව ලොග් සටහන් පොත් යාවත්කාලීනකර නොබුණි.<br>. | අඩුපාඩු ඉදිරියේදී ඇති නොවන ආකාරයට කටයුතු කරන ලෙස අදාළ අංශ දැනුවත්කර ඇති බව දන්වා තිබුණි. | මුදල් රෙගුලාසි 1645 (අ) හි දැක්වෙන විධිවිධාන ප්‍රකාරව පොදු 267 ආකෘතිය ප්‍රකාරව වාහන ලොග් පොත් සෑම වාහනයක් සම්බන්ධයෙන්ම පවත්වා ගත යුතු ය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 128(2)(ඉ) ප්‍රකාරව රාජ්‍ය ආදායම ගණන්දීමේ නිලධාරීන් විසින් රජයට ලැබිය යුතුව තිබෙන හිඟ ආදායම් අප්‍රමාදව අයකර ගැනීම සම්බන්ධව විශේෂ විධිවිධාන යෙදිය යුතු වුවත්, 2023 දෙසැම්බර් 31 දින වන විට අයවිය යුතු හිඟ ආදායම රු.324,716,556 ක් වූ අතර එම හිඟ ශේෂය තුළ වර්ෂ 10ට වැඩි රු.105,441,141 ක් ද, වර්ෂ 7 – 9 දක්වා රු.38,786,239ක් ද, වර්ෂ 4 – 6 ත් අතර රු.35,561,472 ක් ද සහ වර්ෂ 01–03 දක්වා රු.56,669,736 ක් ද ඇතුළත්ව තිබුණි. | 2023 වර්ෂයේ ගාස්තු ඉහළ නැංවීම හේතුවෙන් පෙර වර්ෂවලට සාපේක්ෂව මුළු හිඟ ආදායම ඉහල අගයක් ගන්නා බවද, හිඟ ආදායම් අයකර ගැනීම සඳහා දෙපාර්තමේන්තුව විවිධ ක්‍රියාමාර්ග අනුගමනය කරන අතර, අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්තුමා විසින් ණයශේෂ පිළිබඳ සාකච්ඡාවක් 2024 මාර්තු 25 වන දින පැවැත් වූ අතර, මෙම ණයශේෂ ගෙවීම සඳහා අදාළ ආයතන භාර අමාත්‍යාංශ ලේකම්වරු දැනුවත් කරන බව ද, දන්වා තිබුණි. | යොමුගත මුදල් රෙගුලාසි ප්‍රකාරව හිඟ ආදායම් අප්‍රමාදව අයකරගැනීමට කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයේ මූලා ප්‍රකාශන අනුව ඉකුත් වර්ෂවලට අදාළ හිඟ ආදායම රු.239,837,828 ක් වූ අතර, ඉන් සමාලෝචිත වර්ෂය තුළදී එම කාලයට අදාළ අයකිරීම් රු.23,117,210 ක් වූ අතර, එය ප්‍රතිශතයක් ලෙස සියයට 10 ක් වැනි අඩු අගයක් ගෙන තිබුණි. 2022 වර්ෂය වනවිට වර්ෂ 10 ට වැඩි එනම් 2005 – 2012 දක්වා කාලයට අදාළ හිඟ ආදායම් ශේෂය රු.96,802,469 ක් වූ අතර, 2023 වර්ෂයේදී ඉන් රු.5,818,810 ක් හෙවත් සියයට 6 ක් පමණක් අය කරගෙන තිබුණි. | ඉහත 2.1(අ) පිළිතුරම සඳහන්කර ඇත. | හිඟ ආදායම් අප්‍රමාදව අයකරගැනීමට කටයුතු කළ යුතු ය. |
| (ඇ) | හිඟ ආදායම් උපලේඛනය අනුව 2005 වර්ෂයේ සිට ලබාදුන් සේවාවන් සඳහා ගාස්තු අයකර ගැනීමකින් තොරව ආයතන 13 ක් සඳහා නැවත නැවත සේවා සැපයීම හේතුවෙන් 2005 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වාම රු.35,519,200 ක සේවා සැපයුම් ගාස්තු අයවීමට තිබුණි. | දීර්ඝ කාලයක සිට හිඟ ණය මුදල් නොගෙවා ඇති ආයතන නැවත නඩු කටයුතු සඳහා යොමු වන තත්වයක් තුළ නඩු ප්‍රතික්ෂේප කළ නොහැකි බැවින් නැවත නැවතත් සේවා සැපයීමට සිදුව ඇති බව දන්වා තිබුණි. | හිඟ ආදායම් අප්‍රමාදව අයකරගැනීමට කටයුතු කළ යුතු ය. |
| (ඈ) | මුදල් රෙගුලාසි 175 (2) ප්‍රකාරව හිඟ මුදල් සම්බන්ධයෙන් අප්‍රමාදව නීති ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කළයුතු බව දක්වා තිබුණ ද, ආයතන 60 කින් රු.6,777,170 ක් වූ හිඟ ආදායම් අයකරගැනීමට වසර 03 සිට වසර 18 ක පමණ කාලයක් ගත වී තිබුණ ද, ඒ පරිදි කටයුතු කිරීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි. | අදාළ ආයතන 60 සම්බන්ධයෙන් ද ණයශේෂ අය කරගැනීමට අනුගමනය කරනු ලබන ක්‍රියාමාර්ග අනුව කටයුතු කිරීමට සහ මෙම වර්ෂය තුළ වසර 10ට වැඩි ණයශේෂ අය කරගැනීම සඳහා ප්‍රමුඛතාවයක්දී කටයුතු කිරීමටත්, අතිරේක ක්‍රියාමාර්ග අනුගමනය කිරීමටත් කටයුතු යොදා ඇති බව දන්වා තිබුණි. | යොමුගත මුදල් රෙගුලාසි ප්‍රකාරව හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | ණයගැති ලෙජර නියැදි පරීක්ෂාවට අනුව 2020, 2021, 2023 වර්ෂවලට අදාළව ආරම්භක ශේෂය අවසාන ශේෂය පැහැදිලිව හඳුනාගත හැකි පරිදි ණයගැති ලෙජර තුළනය කිරීමට කටයුතු කර නොතිබුණු අතර, වර්ෂයට අදාළ හිඟ ආදායම්වල නිවැරදිතාව පිළිබඳව නිසි පරිදි තහවුරුවක් ලබාගැනීමට හැකියාවක් නොතිබුණි. | සංස්ථා ගිණුම් ශාඛාවේ ගිණුම් තැබීමේ කටයුතු ආරම්භයේ සිටම පරිගණක තාක්ෂණික වැඩසටහනට අනුව සිදු නොවීම නිසා පැරණි පරිගණක කිහිපයක තිබූ දත්ත ඒකාබද්ධකර මෙම ණයශේෂ තුළනයකර පවත්වාගෙන යමින් පවතින බවත්, සමහර ණයශේෂ ඇතුළත් කිරීමේදී මගහැරී ඇති අතර, එම ණයශේෂ නැවත ඇතුළත් කිරීම නිසා මෙම ණය ශේෂයන්හි වෙනස්වීමක් පෙන්නුම්කර ඇති බව දන්වා තිබුණි. | ශේෂ හඳුනාගත හැකි පරිදි ණයගැති ගිණුම් තුළනය කිරීමට කටයුතු කළ යුතු ය. |
| (ඊ) | 2015 ජූලි 20 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛය ප්‍රකාරව රාජ්‍ය ආදායම් ඇස්තමේන්තු කිරීම, රැස්කිරීම, අධීක්ෂණය සහ වාර්තා කිරීම පිළිබඳ මාර්ගෝපදේශයේ 04 ඡේදය පරිදි ආදායම් පරිපාලනය හා ගිණුම්කරණය වැඩිදියුණු කිරීම සඳහාත්, අධීක්ෂණ කටයුතු සහ ප්‍රතිපත්ති විශ්ලේෂණය සඳහාත් ක්‍රමවත් පරිදි වාර්තා පවත්වා ගැනීම අත්‍යාවශ්‍ය වන අතර, එහි සඳහන් (අ),(ආ) සහ (ඉ) පරිදි කටයුතු කිරීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි. | ඉදිරියේදී අදාළ චක්‍රලේඛ පරිදි ක්‍රමවත්ව වාර්තා තබාගැනීමට කටයුතු කරනු ලබන බව දන්වා තිබුණි. | යොමුගත චක්‍රලේඛ විධිවිධාන පරිදි කටයුතු කළ යුතු ය. |

### 2.2 වියදම් කළමනාකරණය

| | **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | පුනරාවර්තන වැය විෂයයන් 04 ක් හා මූලධන වැය විෂයයන් 04 ක් සඳහා ප්‍රතිපාදිත රු.327,500,000කින් රු.104,510,202 ක් ඉතිරිවී තිබූ අතර, එම ඉතිරිවීම් සියයට 27 සිට 97 දක්වා පරාසයක් ගෙන තිබුණි. | අයවැය චක්‍රලේඛ 03/2022 අනුව වියදම් පාලනය කිරීම හා මිලදීගැනීම් සීමා කිරීම නිසා අදාළ වැය විෂයයන්හි ප්‍රතිපාදන ඉතිරිවීමක් සිදු වන බව දන්වා තිබුණි. | ප්‍රමාණවත් පරිදි ඇස්තමේන්තු සකස් කළ යුතු ය. |
| (ආ) | එක් මූලධන වැය විෂයයක් සඳහා වූ රු.9,000,000 ක සම්පූර්ණ ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. | ඉහත 2.2(අ) පිළිතුරම අදාළ වේ. | නිසි අධ්‍යයනයකින් යුතුව වියදම් ඇස්තමේන්තු සකස් කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2023 ජනවාරි 27 දිනැති අංක 01/2023 දරන අයවැය චක්‍රලේඛයේ 02(ඇ)(ii) ඡේදය ප්‍රකාරව වැය විෂයය සංකේතාංක 1403 සඳහා වන වියදම අවම කිරීම හා වැය විෂයය සංකේතාංක 1201 දැඩි පාලනයකට යටත් කළ යුතු වුවත්, මුදල් රෙගුලාසි 66 මගින් පිළිවෙලින් රු.9,000,000 ක් හා රු.7,000,000 ක් ලෙස එනම්, සියයට 18 ක් හා සියයට 58 ක් ලෙස ප්‍රතිපාදන මාරු කරගෙන වියදම් දරා තිබුණි. | නව ගොඩනැගිල්ල සම්පූර්ණයෙන්ම උපයෝජනය ලක්කිරීම හේතුවෙන් විදුලිය හා ජලය සඳහා පිරිවැය ඉහළ යාම හා ලිපිද්‍රව්‍ය මිළ ගණන් ඉහළ යාම නිසා ප්‍රතිපාදන මාරු කරන ලද බව දන්වා තිබුණි. | යොමුගත චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

## 2.3 බැරකම් හා බැදීම්වලට එළඹීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 නොවැම්බර් 30 දිනැති අංක 05/2023 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 3.3 ඡේදය අනුව රු.7,606,240 ක් වූ බැරකම්, බැරකම් ලේඛනයේ සහ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත්කර ඇති බැදීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයේ ඇතුළත්කර නොතිබුණි. | පෙර වර්ෂයේ ගෙවීම්වලට අදාළ ජල, විදුලි හා දුරකතන බිල්පත් ප්‍රමාද වී ලැබීම හේතුවෙන් බැරකම් ලේඛනයට ඇතුළත් කළ නොහැකි වූ බව දන්වා තිබුණි. | යොමුගත චක්‍රලේඛයේ විධිවිධාන පරිදි බැරකම් හෙළිදරව් කළ යුතු ය. |
| (ආ) | මුදල් රෙගුලාසි 94(i) ප්‍රකාරව වෙනත් ආකාරයකට විධිවිධාන සලසා ඇති අවස්ථාවලදී හැර වාර්ෂික ඇස්තමේන්තුවල ඒ සඳහා මුදල් ප්‍රතිපාදන ඇත්නම් විනා කිසිම වියදමකට හෝ බැදීමකට නොබැඳී සිටිය යුතු වුවද,<br>229–1–1–1409 වැය විෂයය යටතේ ඉතිරි කිරීම් රු. 577,652 ක් වුව ද, ප්‍රතිපාදන ඉතිරිය ඉක්මවා ගිය බැරකම් වටිනාකම රු.3,445,301 ක් විය. | 229-01-01-1409 වැය විෂයය යටතේ ඉල්ලුම් කරන ලද සම්පූර්ණ ප්‍රතිපාදන ප්‍රමාණය නොලැබීම නිසා අත්‍යවශ්‍ය ගෙවීම් කිරීමට ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීමෙන් ප්‍රතිපාදන ඉක්මවා ගිය බැරකම්වලට එකඟවීමට සිදුවන බව දන්වා තිබුණි. | යොමුගත මුදල් රෙගුලාසි ප්‍රකාරව ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට නොබැඳිය යුතු ය. |

## 2.4 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ගණන්දීමේ නිලධාරී විසින් සිදුකළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතිකවීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතුකර නොතිබුණි.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | දෙපාර්තමේන්තුව මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කරගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදුකර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ ලිපියෙන් දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් පවත්වාගෙන යාමට යෝජිත කරුණු ඇතුළත් වාර්තාවක් සකස්කර ගණන්දීමේ නිලධාරී වෙත ඉදිරිපත්කර ඇති අතර, එහි සඳහන් කරුණු සම්බන්ධයෙන් සමාලෝචන කටයුතු සිදු කෙරෙමින් පවතින බව දන්වා තිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| (ii) | වාර්ෂික සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීම සිදුවන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු අතර, ඊට අමතරව විගණනය කරනු ලබන අස්ථිත්වයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වග බලාගත යුතු වුවත්, වාර්තාවේ 3.3 (අ) ඡේදයේ සඳහන් විගණන නිරීක්ෂණය හේතුවෙන් එම අවශ්‍යතා ඉටුකර නොතිබුණි. | ප්‍රමාදයන් සිදු වී ඇති බවත්, ඉදිරියේදී අදාළ කාලවකවානු තුළ එම වාර්තා ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු කරනු ලබන බව දන්වා තිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

## 2.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහකර දැක්වේ.

| නිරීක්ෂණය | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| **නීති,රීති හා රෙගුලාසිවලට යොමුව** | **වටිනාකම** | **අනුකූල නොවීම** | | |
| | **රු.** | | | |
| (i) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | | |
| **104 (3)** | | වාහන අනතුරු 28කට අදාළ ප්‍රාරම්භක වාර්තා දින 14 සිට මාස 10 ක කාලප්‍රමාදයක් සහිතව ඉදිරිපත්කර තිබුණි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු සිදු කරන ලෙස අදාළ අංශ දැනුවත් කරන ලද බව දන්වා තිබුණි. | යොමුගත මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| **104(4)** | | 2023 වර්ෂයේ සිදු වූ වාහන අනතුරු 28 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව අවසන් වාර්තා ඉදිරිපත්කර නොතිබුණි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු සිදු කරන ලෙස අදාළ අංශ දැනුවත් කරන ලද බව දන්වා තිබුණි. | යොමුගත මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| **137** | 3,338,973 | මුදල් රෙගුලාසි ප්‍රකාරව සියලුම ගෙවීම් සම්බන්ධයෙන් අනුමත කිරීමේ නිලධාරියා විසින් වවුචරය අනුමත කළ යුතු වුවත්, වවුචර 04ක් එසේ අනුමතකර නොතිබුණි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු සිදු කරන ලෙස අදාළ අංශ දැනුවත් කරන ලද බව දන්වා තිබුණි. | යොමුගත මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| **237 (අ) (i)** | 772,287 | මුදල් රෙගුලාසි ප්‍රකාරව සේවා කිරීම් හා අළුත්වැඩියා කිරීම් 15 කට අදාළව ගෙවීම් කිරීමේදී මුදල් රෙගුලාසි | මුදල් රෙගුලාසි අනුව කටයුතු සිදු කරන ලෙස අදාළ අංශ දැනුවත් කරන ලද බව දන්වා තිබුණි. | යොමුගත මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

| | | | | |
|---|---|---|---|---|
| | | ප්‍රකාරව වගකිව යුතු නිලධාරියකුගේ සහතිකයක් ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. | | |
| | **1642** | වාහන 03 කට සිදු වූ අනතුරු 06 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව පොලීසියට වාර්තා කර නොතිබුණි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු සිදු කරන ලෙස අදාළ අංශ දැනුවත් කරන ලද බව දන්වා තිබුණි. | යොමුගත මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| **(ii)** | **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | | | |
| | • 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛයේ 3.1 ඡේදය | වාහන 09 කට අදාළව චක්‍රලේඛ ප්‍රකාරව ඉන්ධන දහන පරීක්ෂාව සිදුකර නොතිබුණි. | අදාළ චක්‍රලේඛ ප්‍රකාරව ඉන්ධන පරීක්ෂාවන් සිදු කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව ඉන්ධන දහන පරීක්ෂාවක් සිදුකළ යුතු ය. |
| | • 2008 පෙබරවාරි 06 දිනැති සහ 2018 ජනවාරි 24 දිනැති අංක 05/2008 සහ 05/2008 (i) දරන චක්‍රලේඛය | දෙපාර්තමේන්තුවේ මේ දක්වා පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය හඳුන්වාදීම සිදුකර නොතිබුණි. | දෙපාර්තමේන්තුවේ පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සකස්කර අනුමැතිය සඳහා 2024 පෙබරවාරි 13 දින අමාත්‍යාංශය වෙත යොමු කර ඇති බව දන්වා තිබුණි. | යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

## 2.6 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 371(2) ප්‍රකාරව අතුරු අග්‍රිමයක් නිකුත් කිරීමෙන් පසු අදාළ කාර්යය අවසන්කර දින 10 ක් | අතුරු අග්‍රිම නිරවුල් කිරීම දින කිහිපයකින් ප්‍රමාද වී ඇති අතර, ඉදිරියේදී එවැනි ප්‍රමාදයන් සිදු නොවීමට වග බලාගන්නා ලෙස අදාළ නිලධාරීන් දැනුවත් කරන ලද බව දන්වා තිබුණි. | යොමුගත චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි ප්‍රකාරව තත්කාර්යය අතුරු |

| | | | |
|---|---|---|---|
| | ඇතුළත නැවත පියවිය යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ එකතුව රු.660,341 ක් වූ අත්තිකාරම් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතුකර නොතිබුණි. | | අග්‍රිම කාල ප්‍රමාදයකින් තොරව පියවිය යුතු ය. |
| (ආ) | මුදල් රෙගුලාසි අංක 371(4) හි ගණන්දීමේ නිලධාරියා විසින් වුව ද, නිශ්චිත හා අවශ්‍ය නොවන කාර්යයන් සඳහා අත්තිකාරම් ලබා නොගත යුතු වුවත්, රු.5,000 ක අත්තිකාරම් ලබාගෙන එම මුදලම නැවත මුදලින් පියවා තිබුණු අතර, අදාළ කාර්යය නිශ්චිතව සඳහන් නොකළ අවස්ථා 10කදී අත්තිකාරම් ලබාදී තිබුණි. | අත්තිකාරම් ලබාගැනීමේදී අවශ්‍ය කාර්යය නිශ්චිතව සඳහන් කරන ලෙස අදාළ නිලධාරීන් දැනුවත් කරන ලද බව ද, දන්වා තිබුණි. | යොමුගත මුදල් රෙගුලාසි ප්‍රකාරව අවශ්‍ය නොවන කාර්යයන් සඳහා අතුරු අග්‍රිම ලබා නොදිය යුතු ය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 සැලසුම් කිරීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදය ප්‍රකාරව ඉදිරි වර්ෂය සඳහා වන වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ප්‍රවර්ථන වර්ෂයේ දෙසැම්බර් 15 දිනට පෙර සකස්කර ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබාගත යුතු වුවත්, 2023 වර්ෂයට අදාළ ක්‍රියාකාරී සැලැස්ම 2023 මාර්තු 08 දින විගණනය වෙත ඉදිරිපත්කර තිබුණි. | සිදු වූ අතපසුවීමකින් 2023 වර්ෂයට අදාළ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම ප්‍රමාද වූ අතර,2024 වර්ෂයේදී එය නියමිත දිනට සකස්කර ඉදිරිපත්කර ඇති බව දන්වා තිබුණි. | යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව නියමිත දිනට වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කළ යුතු ය. |

**3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව නිලධාරීන් පුහුණු කිරීම, නව ගොඩනැගිල්ල සඳහා ගෘහභාණ්ඩ මිලදීගැනීම සහ ළමා අපයෝජන සිද්ධීන් පිළිබඳ නඩු ප්‍රමාදය අවම කිරීම සඳහා අධිකරණ ක්‍රියාපටිපාටි, ක්‍රියාවලිය වැඩි දියුණු කිරීමට පහසුකම් සැලසීම වෙනුවෙන් පිළිවෙලින් රු.මිලියන 2 ක්, රු. මිලියන 80 ක් සහ රු. මිලියන 10 ක් වෙන්කර තිබුණ ද, එහි මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් රු.මිලියන 0.98 ක්, රු. මිලියන 49.41ක් සහ රු.මිලියන 5.23 ක් වූ අතර, ප්‍රතිශතයක් ලෙස සියයට 49 ක්, සියයට 62 ක් සහ සියයට 52 ක් විය. | නව ගොඩනැගිල්ල සඳහා ගෘහභාණ්ඩ මිලදීගැනීමට සැපයුම් නියෝග ඉදිරිපත් කර තිබූ පරිදි සැපයුම්කරුවන් විසින් භාණ්ඩ සැපයීම සිදු නොකිරීම, මධ්‍යම ඉංජිනේරු කාර්යාංශයේ නිර්දේශ අනුව භාණ්ඩවල පැවති අඩුපාඩු හේතුවෙන් බිල්පත් සංශෝධනයකර තිබීම හා පුහුණු කටයුතු සීමා කිරීම නිසා අදාළ ප්‍රතිපාදන ඉතිරි වූ බව ද, ළමා අපයෝජන සිද්ධීන් පිළිබඳ නඩු ප්‍රමාදය අවම කිරීම සඳහා අධිකරණ ක්‍රියා පටිපාටි, ක්‍රියාවලිය වැඩි දියුණු කිරීමට පහසුකම් සැලසීම වෙනුවෙන් UNICEF ආයතනය මගින් මුදල් නිදහස් කරගැනීමේදී සිදු වූ ප්‍රමාදය හේතුවෙන් එම ප්‍රතිපාදන ඉතිරිවීමක් සිදු වන බව දන්වා තිබුණි. | ක්‍රියාකාරී සැලැස්ම අනුව කාර්යයන් සඳහා වෙන්කළ මුදල් උපයෝජනය කළ යුතු ය. |
| (ආ) | නව ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් රු. මිලියන 10 ක් වෙන්කර තිබුණ ද, කිසිදු කාර්යයක් ඉටුකර නොතිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | ක්‍රියාකාරී සැලැස්ම අනුව කාර්යයන් සඳහා වෙන්කළ මුදල් උපයෝජනය කළ යුතු ය. |

**3.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කළ යුතුව තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.1 ඡේදය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව භාෂාත්‍රයෙන් සකස්කර මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ගතවීමට පෙර සභාගත කිරීම සඳහා නියමිත විධිවිධාන යටතේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු වුවත්, 2022 වර්ෂයේ වාර්ෂික කාර්යසාධන වාර්තාව මාස 05 දින 06 ක කාල ප්‍රමාදයක් සහිතව 2023 නොවැම්බර් 06 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත්කර තිබුණි. | ප්‍රමාද දෝෂයකින් 2023 වර්ෂයේ වාර්ෂික කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම ප්‍රමාද වූ අතර, ඉදිරියේදී නියමිත දිනට වාර්තාව ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවට නියමිත දිනට ඉදිරිපත් කළ යුතු ය. |
| (ආ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය ප්‍රකාර මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ යුතු වාර්ෂික කාර්යසාධන වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත්කර නොතිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන සමඟ කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කළ යුතු ය. |

### 3.4 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 අගෝස්තු 08 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව පිළියෙල කරන ලද ප්‍රසම්පාදන සැලැස්ම තුළ පුනරාවර්තන වියදම් ඇතුළත්කර නොතිබුණු අතර, දෙපාර්තමේන්තුව විසින් සැලසුම් කිරීමකින් තොරව සමාලෝචිත වර්ෂයේ ඔක්තෝබර් 31 දින දක්වා අවස්ථා 06 කදී රු.3,550,442 ක් වැයකර A4 වර්ගයේ ඡායා පිටපත් කඩදාසි පැකට් 2350 ක් මිලදීගෙන තිබුණි.ඊට අමතරව 2023 පෙබරවාරි සිට ඔක්තෝබර් මාසය දක්වා වාර 13 කදී රු.854,550 ක මුද්‍රණ | චක්‍රලේඛය අනුව, පිළියෙල කලයුතු ප්‍රසම්පාදන සැලසුමට ලිපිද්‍රව්‍ය මිලදී ගැනීම් ඇතුළත්කර නොමැති බැවින්, ලිපිද්‍රව්‍ය මිලදී ගැනීම් ඇතුළත් නොකළ අතර, ටෝනර් මිලදීගැනීම් හදිසි අවශ්‍යතා මත මිලදීගැනීමට කටයුතුකර ඇති අතර, එක් ඇණවුමක වටිනාකම රු. 100,000 කට වඩා අඩු මිලදී ගැනීම් වේ. තව ද, ගබඩාවේ පවතින ඉඩකඩ සීමිත බැවින් හා එක් වරකට ගබඩාකර තිබිය හැක්කේ මාස දෙකකට (2) අවශ්‍ය ඡායාපිටපත් කඩදාසි පමණක් බව දන්වා තිබුණි. | යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව සහ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| | යන්ත්‍ර සඳහා ටෝනර් මිලදීගැනීම් සිදුකර තිබුණි. තව ද, ඊට අදාළ ලංසු ලේඛන ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.1 ප්‍රකාරව මුද්‍රා තබන ලද කවරයක් යටතේ ඉදිරිපත්කර නොතිබුණු අතර, එම ලංසු ලේඛනයන්හි ලැබීමේ දිනය ද, මුද්‍රා තබා නොතිබුණි. | | |
| (ආ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.6.1(ඇ) වගන්තිය ප්‍රකාරව මුල් ඇණවුම් කිරීමෙන් පසු භාණ්ඩවල මිල ගණන් අඩු වී නොමැති පසුබිමක කෙටි කාලයක් තුළ මුල් සැපයුම්කරු වෙතින් නැවත ඇණවුම් කිරීමට හැකි නමුත්, වෙළඳපොළ මිල ගණන් සැසඳීමකින් තොරව අවස්ථා 04 කදී රු.1,466,090 ක A4 වර්ගයේ ඡායා පිටපත් කඩදාසි පැකට් 950 ක් මුල් සැපයුම්කරුගෙන් ප්‍රසම්පාදනය කිරීමට කටයුතුකර තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.6.1 වගන්තිය ප්‍රකාරව, මුල් ඇණවුමේ සිට සයමසක කාලයක් තුළ නැවත එකම භාණ්ඩ මුල් සැපයුම්කරුගෙන් ඇණවුම් කළ හැකි බැවින් කෙටි කාලසීමාවක් තුළ මුල් ඇණවුම් සැපයම්කරු වෙතින් ඇණවුම් කිරීම් සිදුකර ඇති බව දන්වා තිබුණි. | යොමුගත ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| (ඇ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ ඡේද අංක 4.2.1 ප්‍රකාරව අවම වශයෙන් වසර 03 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ඇතුළත් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙලකර නොතිබුණි. | වසර 03 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ඇතුළත් ප්‍රධාන ප්‍රසම්පාදන සැලසුමක් පිළියෙළකර නොමැති අතර, ඉදිරියේදී ප්‍රධාන ප්‍රසම්පාදන සැලසුමක් පිළයෙළ කරන ලෙස විෂයභාර නිළධාරීන් වෙත උපදෙස් ලබාදෙන ලද බව දන්වා තිබුණි. | යොමුගත ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| (ඈ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ ඡේද අංක 3.4.3 ප්‍රකාරව ආර්ථික වශයෙන් දැන්වීම් පළ කිරීම අවාසි සහගත අයිතමන් ප්‍රසම්පාදනය කිරීම සඳහා අවම වශයෙන් වසරකට වරක් යාවත්කාලීන කරන ලද ලියාපදිංචි සැපයුම්කරුවන්ගේ ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | ඉදිරියේදී සැපයුම්කරුවන් ලියාපදිංචි කරගැනීමටත්, සැපයුම් කරුවන්ගේ ලේඛනයක් පවත්වාගෙන යාමටත් විෂයභාර නිලධාරීන් වෙත උපදෙස් ලබාදෙන ලද බව දන්වා තිබුණි. | යොමුගත ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | 2023 වර්ෂය සඳහා පවිත්‍රතා කටයුතු වෙනුවෙන් 2023 ජනවාරි 20 දින භාෂාත්‍රයෙන් පළකළ පුවත්පත් දැන්වීම් සඳහා ආයතන 05 කින් මිල ගණන් ලැබී තිබුණ ද, වාර්තාවේ දිනය වන විටත් එම සේවාව සඳහා කොන්ත්‍රාත්කරුවෙකු තෝරාගෙන නොතිබුණි. | මේ මිල ගණන් ඉදිරිපත් කළ ආයතන මිල ගණන් කැඳවීමේදී ඉදිරිපත් කරන ලද මූලික අවශ්‍යතා සම්බන්ධයෙන් පැවති අඩුපාඩු සම්බන්ධව ටෙන්ඩර් මණ්ඩලය හා තාක්ෂණික ඇගයීම් කමිටුව අතර, පැවති තීරණ සම්බන්ධව එකඟතාවයක් නොපැවතීම මත 2023 වර්ෂයේ පවිත්‍රතා සේවාව සඳහා කොන්ත්‍රාත්කරුවකු තෝරාගැනීමට නොහැකි වූ බව දන්වා තිබුණි. | නියමිත දිනට පවිත්‍රතා කටයුතු ප්‍රසම්පාදන කළ යුතු ය. |
| (ඊ) | 2022 වර්ෂයේ ඇති කරගත් ගිවිසුම 2023 පෙබරවාරි 28 දිනෙන් අවසන් වීම හේතුවෙන් 2023 මාර්තු 01 දින සිට අගෝස්තු 20 දින දක්වා කාලය සඳහා දැනට පවිත්‍රතා සේවා සපයන ආයතනය වෙතින් සේවාව ලබාගැනීමට 2023 මාර්තු 10 දින හා ජූලි 27 දින පැවති ප්‍රසම්පාදන කමිටු විසින් තීරණය කර තිබූ නමුත්, එම කාලසීමාව සඳහා වලංගු කාර්යසාධන සුරක්ෂණයක් හා විධිමත් ලිඛිත ගිවිසුමකින් තොරව 2023 වර්ෂය සඳහා රු.14,194,147ක මුදලක් ගෙවා නොතිබුණි. | 2022 වර්ෂය සඳහා 2021 වර්ෂයේ පවිත්‍රතා සේවාව වෙනුවෙන් ලංසු කැඳවා ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කරමින් සැපයුම් කරුවකු තෝරා ගැනීමේ කටයුතුකර තිබුණ ද, ලිඛිත ගිවිසුම් ඇතිකර ගැනීම හා කාර්යසාධන බැඳුම්කර ලබාගැනීම් අතපසුවීම සිදුවී ඇති බව දන්වා තිබුණි. | අදාළ කාල සීමාව සඳහා කාර්යසාධන සුරක්ෂණයක් හා ලිඛිත ගිවිසුමක් නොමැතිව ගෙවීම් සිදු නොකළ යුතු ය. |
| (උ) | 2023 ජනවාරි 15 දින සිට 2023 ජූනි 10 දින දක්වා කාලයේදී පුද්ගලික ආයතනයක් වෙතින් ආරක්ෂක සේවාව ලබාගෙන තිබුණ ද, එම කාලසීමාව සඳහා වලංගු කාර්යසාධන සුරක්ෂණයක් හා විධිමත් ලිඛිත ගිවිසුමක් නොමැතිව මෙම ආයතනය වෙත රු.4,077,611ක මුදලක් ගෙවා තිබුණි. | අවස්ථා 03 කදී කෙටිකාලීනව කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීම නිසා වලංගු කාර්යසාධන සුරක්ෂණයන් ලබාගැනීම හා විධිමත් ලිඛිත ගිවිසුමක් දෙපාර්ශවය අතර, අත්සන් නොතැබුව ද අදාළ කාලසීමාව සඳහා අදාළ ආයතනය විසින් සේවය නිසි පරිදි පෙර මිලටම දෙපාර්තමේන්තුවට ලබාදී ඇති බැවින්, ලබාගත් සේවය වෙනුවෙන් ගෙවීම් සිදුකර ඇති බව දන්වා තිබුණි. | කාල සීමාවට අදාළව කාර්යසාධන සුරක්ෂණයක් හා ලිඛිත ගිවිසුමක් නොමැතිව ගෙවීම් සිදු නොකළ යුතු ය. |
| (ඌ) | 2023 වර්ෂය සඳහා ආරක්ෂක සේවා සපයා ගැනීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.8 (ආ) වගන්තිය ප්‍රකාරව ආයතනය විසින් ඉදිරිපත් කරනු ලබන කාර්යසාධන සුරක්ෂණය වැඩ නිම කිරීමට අපේක්ෂිත දිනෙන් පසු දින 28 ක් දක්වා වලංගු විය | පුද්ගලික ආයතනයක් වෙත ආරක්ෂක සේවා කොන්ත්‍රාත්තුව 2023 ජූනි 10 දින සිට 2024 ජූනි 09 දින දක්වා වර්ෂයක කාලසීමාවක් සඳහා පිරිනැමීමට කටයුතු කර ඇත. ඒ අනුව, කාර්යසාධන සුරක්ෂණය 2023 ජූනි 10 දින සිට 2024 ජූලි 07 දින දක්වා ඉදිරිපත්කර යුතු අතර, | යොමුගත ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාර කටයුතු කළ යුතු ය. |

| | | |
|---|---|---|
| යුතු වුවත්, අදාළ ආයතනය හා දෙපාර්තමේන්තුව 2023 ජූලි 10 දින සිට 2024 ජූලි 09 දින දක්වා වර්ෂයක කාලයක් සඳහා ගිවිසුම්ගතව ඇති නමුත් ඉදිරිපත් කරන ලද කාර්යසාධන සුරක්ෂණය 2023 ජූනි 28 දින සිට 2024 ජූනි 27 දින දක්වා පමණක් වලංගුව පැවතුණි. | එය නිවැරදි කිරීමට සැපයුම්කරු වෙත දැනුම්දී ඇති බව දන්වා තිබුණි. | |

## 3.5 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ ඡේද අංක 11.1 ප්‍රකාරව මුදල් රෙගුලාසි 756(6) ඡේදය අනුව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර අවසන් කළ යුතු කාලරාමුවට අනුව භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල පත්කිරීම, භාණ්ඩ සමීක්ෂණ කටයුතු භෞතිකව අවසන් කිරීම හා භාණ්ඩ සමීක්ෂණ වාර්තාව ලබාගැනීම යන කාර්යයන් සිදුකර නොතිබුණි. | ඉදිරි වර්ෂයන්හිදී භාණ්ඩ සමීක්ෂණයන් අදාළ කාලරාමුව තුළ සිදු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇති බව දන්වා තිබුණි. | යොමුගත චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදුකළ යුතු ය. |

## 3.6 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බිම් මහලේ හා පළමු මහලේ වැසිකිළි පද්ධතියෙහි වැසිකිළි උපාංග අස්ථාන ගත වී තිබුණු අතර, 11 වන මහලේ භෝජනාගාරයේ පවතින වීදුරු දොරක් විනාශ වී ඇති බවත්, එහි බිම අතුරා ඇති ටයිල් පිපිරීමට ලක්ව ඇති අතර, මෙම පාඩු/හානි සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 103(1) හා 104(1) ප්‍රකාරව කටයුතුකර නොතිබුණි. | නව ගොඩනැගිල්ලේ සිදුව ඇති හානි හා පාඩු සම්බන්ධයෙන් අදාළ මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරීමට උපදෙස් ලබාදෙන ලද දන්වා තිබුණි. | යොමුගත මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | හානිපාඩු ලේඛනය පරිදි රු.25,000ට වැඩි හානි 29 ක අගය රු.2,878,632ක් වුව ද, මූල්‍ය ප්‍රකාශනයේ ඇමුණුම(i) පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශනයේ වර්ෂය තුළ අලාභ අයකර ගැනීම/කපා හැරීම/අත්හැරීම පිළිබඳ ප්‍රකාශය අනුව හානි 28 ක් ලෙස හා එම අගය රු.2,814,537 ක් ලෙස රු. 64,095 ක් අඩුවෙන් දක්වා තිබුණි. | 2023 මූල්‍ය ප්‍රකාශන සකස් කරන අවස්ථාව වන විට හානිවලට අදාළ සම්පූර්ණ විස්තර ප්‍රවාහන අංශය වෙත නොලැබීමෙන් හානි හා පාඩු ලේඛනය සම්පූර්ණ වී නොතිබුණු අතර, පසුව එය නිවැරදිකර සම්පූර්ණ කිරීමට කටයුතු කිරීම නිසා මෙම වෙනස සිදුවී ඇති බව දන්වා තිබුණි. | පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශනයේ හානි නිවැරදිව සටහන් කළ යුතු ය. |

## 3.7 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුව විසින් නියමිත දිනට විදුලි බිල්පත් නොගෙවීම හේතුවෙන් මාසික පරිභෝජන වියදමට අමතරව එකතුව රු.372,759 ක් වූ පොළී මුදලක් ගෙවා තිබුණි. | අදාළ අක්මුදල් නියමිත දිනට නොලැබීමෙන් විදුලි බිල්පත් ගෙවීම ප්‍රමාදවීම හේතුවෙන් පොළී මුදලක් එකතු වන අතර, ඉදිරියේදී මෙම තත්ත්වය වලක්වා ගැනීමට අවශ්‍ය පියවර ගනු ලබන බව දන්වා තිබුණි. | විදුලි බිල්පත් ගෙවීමේදී පොළියක් නොගෙවන ආකාරයට නියමිත දිනට ගෙවීමට කටයුතු කළ යුතු ය. |

## 3.8 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සේවය හැර ගිය නිලධාරීන් 04 දෙනෙකුගේ රු.485,842 ක හිඟ ණයශේෂයන් වසර 10 කට වැඩි කාලයක සිට අය නොවී පැවතුණු අතර, එක් නිලධාරියකුගේ රු.127,680 ක් වූ ණයශේෂය වර්ෂ 03 කට වැඩි කාලයක සිට ද, තවත් නිලධාරියෙකුගේ රු.113,509 ක ශේෂය වර්ෂ 1 – 3 ත් අතර කාලයක සිට ද අය නොවී පැවතුණි. | අදාළ නිලධාරීන්ගේ ණය අයකර ගැනීම සඳහා නඩු පැවරීමට නීති අංශය වෙත ණයගොනු ඉදිරිපත්කර ඇති බව දන්වා තිබුණි. | ණයශේෂ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | වැඩ තහනම් කිරීමට ලක්ව ඇති නිලධාරීන් 03 දෙනෙකුගේ රු.164,560 ක හිඟ ණයශේෂයන් වසර 10 කට වැඩි කාලයක් අය නොවී පැවතුණි. | අදාළ නිලධාරීන් ගෙන් එක් අයෙකු මිය ගොස් ඇති අතර, තවත් නිලධාරියෙකු පිළිබඳ පදිංචි තොරතුරු සොයා ගත නොහැකි වී ඇත. අනෙක් නිලධාරියාගේ භාර්යාව විසින් කොටස් වශයෙන් ණය ගෙවීම සිදු කරගෙන යනු ලබන අතර, අය කරගත නොහැකි ණය ශේෂයන් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා කමිටුවක් පත් කර ඇති බව දන්වා තිබුණි. | ණයශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු ය. |
| (ඇ) | ඉහත (අ), (ආ) හි සඳහන් වැඩ තහනම් කළ සහ සේවය හැර ගිය නිලධාරීන්ගෙන් අය කරගත යුතු ණයශේෂ සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.5 හා 6.3 වගන්ති ප්‍රකාරව කටයුතුකර නොතිබුණි. | අදාළ හිඟ ණයශේෂයන් අයකර ගැනීම සඳහා ආයතන සංග්‍රහයේ 4.5 හා 6.3 වගන්ති ප්‍රකාරව කටයුතු කරගෙන යනු ලබන බව දන්වා තිබුණි. | පැරණි ණයශේෂ අයකර ගැනීමට යොමුගත ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| (ඈ) | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 හි I කොටසෙහි 3.1 ඡේදයේ මුදල් රෙගුලාසි 113(6)(ආ) යටතේ අත්තිකාරම් “බී” ගිණුම මගින් ලබාදුන් ණය හෝ අත්තිකාරම් මුදල් අයකර ගැනීමේදී කටයුතු කළ යුතු ආකාරය පිළිබඳ මාර්ගෝපදේශයෙහි (ඉ), (ඊ) පරිදි වර්ෂ 10 කට වැඩි කාලයක සිට සේවය හැරගිය සහ වැඩ තහනම්කර ඇති නිලධාරීන් පස්දෙනෙකුට අදාළව රු.459,837 ක් වූ ණයශේෂ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | අයකරගත නොහැකි ණයශේෂයන් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා අමාත්‍යාංශ නියෝජිතයෙකු ගෙන් සමන්විත කමිටුවක් පත්කර ඇති අතර, මේ සම්බන්ධව එම කමිටුවට කරුණු ඉදිරිපත්කර ඇති බව දන්වා තිබුණි. | යොමුගත චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි ප්‍රකාරව ණය අයකර ගැනීමට කටයුතු කළ යුතු ය. |

**4.** **තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අප්‍රේල් 27 දිනැති අංක එම්එස්ඩීඩබ්/08/65 දරන තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද ලිපිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් තිරසර සංවර්ධන අරමුණු හඳුනාගෙන තිබුණ ද, තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මැන බැලීම සඳහා වන ඉලක්ක හඳුනාගෙන නොතිබුණු අතර, එම තිරසර සංවර්ධන අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධීකරණය කිරීමට නිලධාරීන් පත් කොට තිරසර සංවර්ධන වැඩසටහනක් පිළියෙල කර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධීකරණ කිරීම සඳහා නිලධාරියෙකු පත් කිරීමට කටයුතු කරන ලද අතර, හඳුන්වාදී ඇති අරමුණ ඉටුකර ගැනීම සඳහා දෙපාර්තමේන්තුවේ විවිධ අංශ පිහිටුවා විවිධ ක්‍රියාමාර්ග ගනු ලබන අතර, ඉදිරියේදී තිරසර සංවර්ධන වැඩසටහනක් පිළියෙල කිරීමට කටයුතු කරනු ලබන බව ද දන්වා තිබුණි. | යොමුගත ලිපිය ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

**5.** **මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය 1295 ක් වුව ද, තථ්‍ය කාර්ය මණ්ඩලය 671 ක් වූයෙන් නිලධාරීන් 624 ක පුරප්පාඩු පැවතුණි. එය අනුමත කාර්ය මණ්ඩලයෙන් සියයට 48 ක ප්‍රමාණයක් විය. | නවක රජයේ අධිනීතිඥවරුන් 25 දෙනෙකු බඳවාගැනීමට සම්මුඛ පරීක්ෂණ පවත්වා අවසන්කර ඇති අතර, 2024 වර්ෂය තුළදී බඳවාගැනීමට ද අනෙකුත් පුරප්පාඩු සම්පූර්ණ කරගැනීම සඳහා රාජ්‍ය සේවා කොමිසම හා ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත අවස්ථා කිහිපයකදීම දැනුම්දී ඇති බව දන්වා තිබුණි. | පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු ය. |
| (ආ) | දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය කෙරෙහි සෘජුවම බලපානු ලබන ජ්‍යෙෂ්ඨ මට්ටමේ අනුමත තනතුරු 523 ක් පැවතිය ද, 2023 දෙසැම්බර් 31 දිනට තථ්‍ය කාර්ය මණ්ඩලය 215ක් වීම හේතුවෙන් නිලධාරීන් 308 ක පුරප්පාඩුවක් පැවතුණි. එය අනුමත කාර්ය මණ්ඩලයට සාපේක්ෂව සියයට 59 ක අගයක් විය. | ඉහත 5 (අ) පිළිතුරම සඳහන්කර ඇත. | පුරප්පාඩු පැවතීම දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය කෙරෙහි බලපාන බැවින් පුරප්පාඩු සම්පූර්ණකර ගැනීමට කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | තෘතීයික හා ද්විතීක මට්ටමේ තනතුරු සඳහා අනුමත නිලධාරීන් සංඛ්‍යාව පිළිවෙලින් 15 ක් හා 354ක් වුව ද, 2023 දෙසැම්බර් 31 දිනට සත්‍ය වශයෙන් සිටින කාර්ය මණ්ඩලය පිළිවෙලින් 07 ක් හා 157ක් වීම හේතුවෙන් තෘතීයික හා ද්විතීක මට්ටමේ නිලධාරීන් 205 ක පුරප්පාඩුවක් පැවතුණි. එය අනුමත කාර්ය මණ්ඩලයට සාපේක්ෂව සියයට 56 ක අගයක් විය. | ඉහත 5 (අ) පිළිතුරම සඳහන්කර ඇත. | පුරප්පාඩු පැවතීම දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය කෙරෙහි බලපාන බැවින් පුරප්පාඩු සම්පූර්ණකර ගැනීමට කටයුතු කළ යුතු ය. |
| (ඈ) | ප්‍රාථමික මට්ටමේ අනුමත තනතුරු 403 ක් වුවද, 2023 දෙසැම්බර් 31 දිනට සත්‍ය වශයෙන් සිටින කාර්ය මණ්ඩලය 292 ක් වීම හේතුවෙන් නිලධාරීන් 111 ක පුරප්පාඩුවක් පැවතුණි. එය අනුමත කාර්ය මණ්ඩලයට සාපේක්ෂව සියයට 28ක අගයක් විය. | ඉහත 5(අ) පිළිතුරම සඳහන්කර ඇත. | පුරප්පාඩු පැවතීම දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය කෙරෙහි බලපාන බැවින් පුරප්පාඩු සම්පූර්ණකර ගැනීමට කටයුතු කළ යුතු ය. |
| (ඉ) | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 04 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සැලැස්මක් සකස්කර අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතියට ඉදිරිපත්කර ඇති නමුත්, විගණිත වාර්තාවේ දිනය වන තෙක් එය අනුමතකර නොතිබුණු අතර, චක්‍රලේඛයේ 01 ඡේදය ප්‍රකාරව සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කිරීම අවසන්කර නොතිබුණි. | මේ වන විට දෙපාර්තමේන්තුවේ සමස්ථ කාර්යමණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව දන්වා තිබුණි. | යොමුගත චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |